www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කොමිසම ශ්‍රී ලංකා ආන්ඩුවේ යුද අපරාධ වසං කරයි

## UN body covers up Sri Lankan government's war crimes

**2009 මැයි 29**

**විජේ ඩයස් විසිනි**

එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කොමිසම (යූඑන්එච්ආර්සී) පසුගිය බදාදා ජිනීවා නුවරදී ශ්‍රී ලංකා මිලිටරියේ යුද අපරාධ පිලිබඳ කුමන හෝ පරීක්ෂනයක් අත්හිටුවන යෝජනාවක් සම්මත කරමින්, ආන්ඩුව එල්ටීටීඊයට විරුද්ධව අත් කර ගත් වාර්ගික යුද්ධයේ ජයග්‍රහනය වෙනුවෙන් ශුභ පැතීය.

බ්‍රිතාන්‍ය හා ප්‍රන්සයේ මූලිකත්වයෙන් යුරෝපීය බලවතුන්ගේ ඉල්ලීම පරිදි දින දෙකක සැසි වාරය කැඳවනු ලැබ තිබුනි. ශ්‍රී ලංකාවේ යුද්ධය පැවති වකවානුව තුල මිලිටරිය හා එල්ටීටීඊ යන දෙකම මානව හිමිකම් හා ජාත්‍යන්තර නීතිය උල්ලංඝනය කිරීම පිලිබඳව පරීක්ෂනයක් ඉල්ලමින්, ස්විට්සර්ලන්තය විසින් ඉදිරිපත් කොට තිබූ සීමිත යෝජනාවකට ඔවුහු සහයෝගය දුන්හ.

චීනය, ඉන්දියාව හා රුසියාව යන රටවල පිටුබලය සහිතව ශ්‍රී ලංකාවේ ආන්ඩුව, සිය යුද මෙහෙයුම්, මිලිටරියේ දෙමල සිවිල් වැසියන් ඝාතනය හා 300,000 පමන දෙමල සරනාගතයන් අනිවාර්ය රඳවාගැනීමකට යටත් කිරීමට සුදු හුනු ගෑම සඳහා ප්‍රතිවිරුද්ධ යෝජනාවක් ගෙන ආවේය. දින දෙකක කර්කශ අඬදබරයයකින් පසුව කොමිසම, ඡන්දය දීමෙන් වැලකී සිටි සය දෙනෙකු සහිතව පක්ෂව 29 හා විපක්ෂව 12 ක් ලෙස ආන්ඩුවේ යෝජනාව සම්මත කලේය.

කොමිසම, මූලික ප්‍රජාතන්ත්‍රීය අයිතීන් හි හා ජාත්‍යන්තර නීතියේ ආරක්ෂකයෙකු ය යන කුමන හෝ කියාපෑමක් මෙම යෝජනාව මගින් සමච්චලයට ලක් කර තිබේ. කොලඹ ආන්ඩුව හා එහි අනුග්‍රාහකයන් අවධාරනය කලේ සිවිල් යුද්ධය වනාහි අභ්‍යන්තර ප්‍රශ්නයක් බවයි. යෝජනාව, "අවශ්‍යයෙන්ම රාජ්‍යයන්ගේ දේශීය අධිකරන බලාධිකාරය ඇතුලත සිදුවන කාරනාවන් පිලිබඳව මැදිහත් නොවීමේ මූලධර්මය යලි අවධාරනය" කලේය.

ආන්ඩුවේ ප්‍රචාරක භාෂාවෙන් ලියා තිබූ යෝජනාවට, සිවිල් ජනතාව "මිනිස් පලිහක්" ලෙස යොදාගැනීම සම්බන්ධයෙන් එල්ටීටීඊය හෙලාදැකීම ද, "දිවයිනේ උතුර විමුක්ත කර ගැනීම" සාදරයෙන් පිලිගැනීම ද දෙමල සරනාගතයන්ගේ අවශ්‍යතාවන් පිලිබඳව අවධානය යෙදීම ගැන අන්ඩුවට "ප්‍රශංසා" කිරීම ද "සියලු මානව අයිතීන් ආරක්ෂාකර ප්‍රවර්ධනය කිරීම පිලිබඳ එහි අඛන්ඩ කැපවීම" සාදරයෙන් පිලිගැනීම ද ශ්‍රී ලංකාවේ ආර්ථිකය සඳහා මූල්‍යාධාර සැපයීමට "ජාත්‍යන්තර ප්‍රජාවෙන්" කල ඉල්ලීම ද ඇතුලත් විය.

යෝජනාව, යථාර්තය ඔලුවෙන් සිටුවා තිබේ. මාස ගනනක් තිස්සේ හමුදාව, යුද කලාපයේ කොටුවී සිටි 250,000 වැඩි දෙමල සිවිල් ජනතාවගේ ඉරනම සාපරාධී ලෙස නොතකා හරිමින් එල්ටීටීඊය විසින් අල්ලාගෙන සිටි අවසන බිම් කඩ අල්ලා ගැනීමේ අනවරත ප්‍රහාරයක යෙදී සිටියේ ය. එක්සත් ජාතීන්ගේ ගනන් හිලව්වලට අනුව ජනවාරි අවසානයේ සිට මැයි මාසයේ මැද දක්වා කාලය තුල, වැඩි කොටම ඉවක් බවක් නැතිව හමුදාව එල්ල කල බෝම්බ ප්‍රහාර මගින්, සිවිල් වැසියන් 7,000 කට වැඩි පිරිසක් මිය ගොස් තවත් විශාල පිරිසක් තුවාල ලබා හා අංග විකල කරනු ලැබ ඇත.

දෙමල වැසියන් "විමුක්ත කර ගැනීම" කෙසේ වෙතත්, හමුදාව ඔවුන් ගාල්කර ඇත්තේ, සන්නද්ධ සෙබලුන් විසින් රැකවල් ලා ඇති මුවහත් කටු කම්බි වැටවල් වලින් වටකල දැවැන්ත රැඳවුම් කඳවුරු තුලට ය. මිලිටරි බුද්ධි ඒජන්තයන් හා ආන්ඩුවට ගැති විවිධ අර්ධ සන්නද්ධ කල්ලි මෙම මධ්‍යස්ථාන තුල නිදැල්ලේ හැසිරෙමින් ඊනියා "එල්ටීටීඊ සැකකරුවන්" අල්ලා, රහසිගත සිර කඳවුරු තුල රඳවා තබා ඇත. දුෂ් පෝෂනයෙන්, ව්‍යාධීන්ගෙන් හා තුවාලවලින් පීඩාවට පත්ව ඇති බොහෝ රැඳවියන් ට ප්‍රමානවත් ආහාර, වෛද්‍ය පහසුකම් හා මූලික පහසුකම් කිසිවක් ලබාගත නොහැකිවී ඇත.

ජාත්‍යන්තර රතු කුරුස සංවිධානය ද (අයිසීආර්සී) ඇතුලු විවිධ ජාත්‍යන්තර සංවිධාන, රැඳවුම් කඳවුරු තුල තත්වය ගැන දැඩි නොසතුට පලකර

ඇති අතර, ඒවා කරා පිවිසීමට ආන්ඩුව පනවා ඇති තහංචි ඉවත් කරන ලෙස ඉල්ලා තිබේ. කෙසේ වෙතත් මානව හිමිකම් කොමිසමේ යෝජනාව, රැඳවියන්ට ලැබෙන ආන්ඩුවේ සැලකිල්ල හා ජාත්‍යන්තර ආධාර සංවිධාන වලට "අදාලත්වය අනුව පමනක් පිවිසීමේ පහසුකම්" සැලසීම පිලිබඳ එහි තීරනයට අනුමැතියේ ලාංඡනය තබා ඇත.

රටේ දෙමල සුලුතරයට එරෙහිව දශක ගනනාවක් ක්‍රමානුකූලව නිල වශයෙන් ගෙන ගිය වෙනස්කම් කිරීම තුල පවතින යුද්ධයේ සැබෑ මූලාශ්‍රයන්, යෝජනාව මඟින් වසං කරනු ලැබ හා, "කල්පවත්නා සාමයක් හා සන්හිඳියාවක්" පිලිබඳ ජනාධිපති මහින්ද රාජපක්ෂගේ ප්‍රෝඩාකාරී ප්‍රතිඥාවන්ට විශ්වාසනීයත්වයක් ගෙන දී ඇත. යෝජනාව මඟින් සිදුවනු ඇත්තේ, රටේ උතුර හා නැගෙනහිර මිලිටරි පාලනය යටතේ තැබීමෙන්, සිංහල අධිපතිවාදී රාජ්‍යය තහවුරු කර ගැනීමේ අරමුන සහිත කොලඹ දේශපාලන සංස්ථාපිතයේ දක්ෂිනාංශික හා වර්ගවාදී ස්ථරයන්ගේ අත ශක්තිමත් කිරීම පමනකි.

මෙම ප්‍රතිපලයෙන් නොමඳව උද්දාමයට පත් මානව හිමිකම් පිලිබඳ ඇමති මහින්ද සමරසිංහ, "ත්‍රස්තවාදය මුලිනුපුටා දැමීමේ අපගේ ව්‍යායාමයට ලැබුනු පැහැදිලි වරමක්" ලෙස එය හැඳින්වී ය. විදේශ ඇමති රෝහිත බෝගොල්ලාගම මෙම ඡන්දය ගැන උදම් ඇනුවේ "ලෝක ගෝලය පුරා රාජ්‍යයන්හි සහයෝගයේ අර්ථයෙන් ගත් කල ශ්‍රී ලංකාව ඉහලින්ම නැගී සිටින බව මෙයින් පෙන්නුම් කරන්නේ" යයි පවසමිනි.

අද දිනයේ කොලඹ මාධ්‍ය කතුවැකි වලින් මෙම තීන්දුව, ශ්‍රී ලංකාව ලත් තවත් විශිෂ්ඨ ජයග්‍රහනයක් ලෙස හුවා දැක්වින. ජිනීවා නුවර ශ්‍රී ලංකා තානාපති දයාන් ජයතිලකගේ "රාජ්‍යතාන්ත්‍රිකයේ විශිෂ්ඨ පහරවල්" ඔජ වැඩීමෙන් අනතුරුව ඩේලි මිරර් පත්‍රය ප්‍රකාශ කලේ, "ආසියානුන් හා අප්‍රිකානුන් තමන්ගේ සැබෑ ශක්‍යතාවය අවබෝධ කර ගැනීමට පටන් ගෙන තිබෙන බව" මෙම විශිෂ්ඨ ජයග්‍රහනයෙන් පෙන්නුම් කර ඇති බව ය.

"රාජ්‍යතාන්ත්‍රික ත්‍රස්තවාදයට එරෙහිව ලැබූ ජයග්‍රහනයක්" යන සිරස්තලයෙන් ද අයිලන්ඩ් පත්‍රය පලකලේ "ජිනීවාහිදී ඩේවිඩ් ගොලායත් ව පෙරලා දමා....බටහිර කඳවුර හා එහි හෙංචයියන් විසින් ඇයට මඩ ගැසීමට හා ඇය එල්ලීමට ගත් බියගුලු උත්සාහය හමුවේ ශ්‍රී ලංකාවට, ලෝකයේ ඉමහත් පිටුබලය ලැබී තිබේ" යනුවෙනි. මීට පෙර ප්‍රකාශවල දී දක්ෂිනාංශික පුවත්පත, තමන්ම නම් කල පද යොදාගනිමින් බටහිර නව යටත් විජිතවාදය ඉදිරියේ නැගී සිටීම සඳහා මුලු හදින්ම ජනාධිපති රාජපක්ෂට පිටුබලය දුන්නේය.

නව යටත්විජිතවාදයට එරෙහිව නැගී සිටීම හෝ ශ්‍රී ලංකාවේ විශිෂ්ඨ රාජ්‍යතාන්ත්‍රික භාවය සමඟ හෝ මෙම ඡන්දය ගැට්ලාවත් ඇත්තේ නැත. රුසියාව, චීනය හා ඉන්දියාව ඇතුලු මානව කොමිසමේ යෝජනාවට පිටු බලය දුන් සියලුම දෙනා එක් හෝ තවත් අතකින් එක්සත් ජනපදයේ මූලිකත්වයෙන් ඉරාකයේ හා ඇෆ්ගනිස්ථානයේ සිදු කරන නව යටත්විජිතවාදී වාඩිලෑමට දිගටම සහාය දෙති. ඔවුන් සිල්ලන්ම ශ්‍රී ලංකාවේ යෝජනාවට සහාය දුන්නේ ඔවුන්ගේ ම ආර්ථික හා මූලෝපායික අවශ්‍යතාවන්හි මෙන්ම, ඔවුන්ගේ ම අභ්‍යන්තර මිනිස් අයිතිවාසිකම් උල්ලංඝනය කිරීම් වෙත අවධානය යොමුවීම වලක්වන, ආරක්ෂනයක පදනම මත ය.

ශ්‍රී ලංකා "ඩේවිඩ්" බටහිරට එරෙහිව නැගී සිටින විට එහි මුල්ලක ගොලායත්ලා කිහිප දෙනෙකු, විශේෂයෙන්ම චීනය, නොසිටියේ නම් කිසි විටෙකත් එය සිදු නොවිය හැකිව තිබුනි. සාමාන්‍යයෙන් සිය අවම මට්ටමේ රාජ්‍යතාන්ත්‍රික හැසිරීම් පසෙක දමා, යුරෝපීය බලවතුන්ට හා එක්සත් ජනපදයට ඍජු අභියෝගයක් එල්ල කිරීමෙහි ලා සහාය දැක්වීමට බීජිනය ගත් තීන්දුව, සිය බලපෑම අවධාරනය කිරීම සඳහා චීනයේ ඇති අධිෂ්ඨානය පිලිබඳ සැලකිය යුතු ඇඟවීමකි. වැහැරෙන වොෂින්ටනයට, විශේෂයෙන්ම ගෝලීය ආර්ථික අර්බුදය ගැඹුරුවන තතු යටතේ, ප්‍රති බලයක් ලෙස බීජිනය දැකගෙන ඇත්තේ ශ්‍රී ලංකාව විසින් පමනක්ම නොවන අතර, එයින් දිරිමත් වන චීනය වඩාත් අධිකාරවත් වනු ඇත.

චීනය රාජපක්ෂ ආන්ඩුවට දේශපාලන සහයෝගය පමනක් නොව මූල්‍ය හා මිලිටරි ආධාර ද සපයා ඇත. එක්සත් ජනපදය හා ජපානය අභිබවා යමින් බීජිනය දැන් ලංකාවට ආධාර සපයන ප්‍රමුඛයා බවට පත්ව සිටියි. වාර්තාවී ඇති පරිදි ප්‍රහාරක ජෙට් යානා හයක් නොමිලයේ සැපයීම ද ඇතුලුව එය ලොකුම අවි සැපයුම් කරුවා බවට පත්ව ඇත. එයට හිලව් වශයෙන් ශ්‍රී ලංකා බටහිර මුහුදු තීරයේ තෙල් ගවේෂන අයිතිය ද, මැද පෙරදිග හා අප්‍රිකාව කරා නාවික වෙලඳ මාර්ග සුරක්ෂිත කර ගැනීමේ බීජින් හි සැලසුම්වල දී තීරනාත්මක විය හැකි, දකුනේ හම්බන්තොට වරාය ඉදිකිරීමේ හා මෙහෙයවීමේ අයිතිය ද, චීනයට පැවරී තිබේ.

කොලඹ තුල ස්වකීය බලපෑම් ශක්තිමත් කර ගැනීමේ අදිටනින් රුසියාව හා ඉන්දියාව ද යෝජනාවට සහාය දැක්වූහ. තමන්ගේම "අභ්‍යන්තර කටයුතු" කෙරෙහි එක්සත් ජාතීන්ගේ කුමන හෝ මැදිහත්වීමක්, විශේෂයෙන්ම කාශ්මීරය තුල, වලක්වා ගැනිම පිලිබඳව මෙන්ම, ඉන්දියාව ස්වකීය බල වැයික්කිය ලෙස සලකන කලාපයෙහි එදිරිවාදී චීනය පැල පදියම්වීමට

අවහිර කිරීම කෙරෙහි නවදිල්ලියේ අවධානය යොමුව තිබේ.

තිරයට පිටුපස සිට එක්සත් ජනපදයෙන් ලැබෙන තල්ලුවත් ඇතිව සිටින යුරෝපීය බලවත්තු, මානව හිමිකම් සමුලුවේ දී තමන් හැල්ලුවට ලක් වීම ගැන තිගැස්සුනහ. යුරෝපා සංගමයේ (ඊයූ) ප්‍රකාශය, "ශ්‍රී ලංකාව තුල බරපතල මානව හිමිකම් කඩකිරීම් හා මානව අර්බුදය පිලිබඳව අවධානය යොමු කරමින්" එක්සත් ජාතීන්ගේ එම ආයතනයට පිලිගත හැකි ප්‍රතිපලයක් මත එකගතාවක් ඇතිකර ගැනීමට නොහැකි වීම ගැන කනගාටුව පල කලේය. කැනේඩියානු නියෝජිත ටෙරී කෝමියර් මෙසේ පැවසී ය. "අපගේ සාධාරන යෝජනා ප්‍රතික්ෂේප කිරීම පිලිබඳව හා මෙම ප්‍රතිපලයෙන් කොමිසමේ විශ්වාසනීයත්වය තවදුරටත් පලුදු වීම පිලිබඳව අපි කනගාටු වන්නෙමු."

ශ්‍රී ලංකාවේ මානව අයිතීන් කඩවීම් කෙරෙහි දැක්වෙන මෙම සාටෝපයන් තිබිය දී ම, එක්සත් ජනපදය හා එහි යුරෝපීය සගයන් "මානව අයිතීන්" පිලිබඳ කාරනය හැම විටම යොදා ගෙන ඇත්තේ ස්වකීයවූ ආසක්තයන් වෙනුවෙන්, බෙහෙවින්ම තෝරා ගත් ආකාරයකට ය. එක්සත් ජනපදයේ මූලිකත්වයෙන් ඇෆ්ගනිස්ථානයේ මිලිටරි ග්‍රහනය ආශ්‍රිතව සිදුකර තිබෙන යුද අපරාධ සඳහා වගකිව යුතු වනවාට අමතරව යුරෝපා සංගමය, එක්සත් ජනපදය, ජපානය හා නෝර්වේ රාජ්‍යයන් සමග, ශ්‍රී ලංකාවේ සාම ක්‍රියාදාමයෙහි ඊනියා ජාත්‍යන්තර සම සභාපති වරුන් සිව් දෙනාගෙන් එක් පාර්ශවයකි. ආන්ඩුව 2002 සටන් විරාමය උල්ලංඝනය කිරීමේදීත්, මානව අයිතිවාසිකම් කඩකිරීමේදීත්, වසර දෙකකටත් වැඩි කාලයක් පුරා සම සභාපතිවරු නෑසූ කන්ව සිටියේ, මෑත මාසවල යුද්ධය එහි අවසානය කරා ලගාවෙමින් තිබෙන බව පැහැදිලි වීමට පටන් ගත් කල ප්‍රශ්නය කොලඹ ආන්ඩුව මත බලපෑම් කල හැකි හොඳ දේශපාලන තුරුම්පුවක් බවට පත්වන තෙක් ය.

තම තමන්ට විශේෂිත වූ ආසක්තයන් මත, සමුලුව තුල වෙනස් "මූලධර්මයන්ගේ" ධජයන් යටතේ වූ, සියලු ලොකු හා කුඩා බලවතුන්ගේ අඬ දබරය පිලිබඳ තුච්ඡ සංදර්ශනය, සිහියට නංවන්නේ ජාතීන්ගේ සංගමය "හොරුන්ගේ කුස්සිය" ලෙස ලෙනින් කල සුප්‍රසිද්ධ හැඳින්වීමයි. තවද, මානව අයිතිවාසිකම් කම්ටුවට, එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මන්ඩලය හෝ මහා මන්ඩලය තරම් බලතල හෝ සම තත්වයක් නොතිබිය ද, රාජ්‍යතාන්ත්‍රික බැට හුවමාරුව වනාහි, තියුනු වන ගෝලීය ආතතීන් හා වඩාත් දරුනු අතට හැරෙන අනාගත ගැටුම්වලට නිමිති වන මහා බලවතුන් අතර දෝෂ සහගත පිලිවෙත් සම්බන්ධ ඇඟවුමකි.

© www.wsws.org